**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2019/2020**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2022 ජූලි)**

# BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවනතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) හා පිටු හතරකින් (04) හතරකින් සමන්විතය.

(2) (අ) කොටසේ **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු** අතර (ආ) කොටසේ **ප්‍රශ්න දෙකකට (02)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(3) කාලය පැය දෙකයි (02).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## (අ) කොටස

**ප්‍රශ්න අංක 01**

i. "නිවසේ සිට වැඩ කිරීම" (Work from home) යන සංකල්පය ශ්‍රී ලංකාව තුල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පැනනගින ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.*

(ලකුණු 10)

ii. "ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය" ඉහල යාම හමුවේ ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. *

(ලකුණු 10)

iii. "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්තිය" පහල යාම හමුවේ ශ්‍රී ලංකා රජය වර්තමානයේ මුහුණ දෙන ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.*

(ලකුණු 10)

***ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු සැපයීමේදී පහත ආකෘතිය භාවිත කරන්න.**

| ගැටළුව | ගැටළුව පැහැදිලි කිරීම | යෝජනාව | යෝජනාව පැහැදිලි කිරීම |
|---|---|---|---|
| | | | |

**ප්‍රශ්න අංක 02**

පහත සංකල්ප කෙටියෙන් පහදන්න

i. රැකියා ආචාරධර්ම (Work ethics)
ii. වැඩවලදී බියගැන්වීම (Workplace bullying)
iii. වැඩ නිරීක්ෂණය (Surveillance at work)
iv. චිත්තවේගීය ශ්‍රමය (Emotional Labour)
v. විවිධත්ව කළමනාකරණය (Managing Diversity)

(ලකුණු 02 x 5=10)

(මුළු ලකුණු 40)

<u>(ආ) කොටස</u>

**ප්‍රශ්න අංක 03**

i. "ආයතනික සමාජ වගකීම් (Corporate Social Responsibility) ආයතනික තිරසාර පැවැත්ම (sustainability) යන මූලධර්මය සමඟ සමීපව බැඳී පවතී". මෙම ප්‍රකාශය සමග ඔබ එකග වේද? ආයතනික සමාජ වගකීම් ඉටුකිරීම තුලින් ආයතනයකට ලබාගත හැකි ප්‍රතිලාභ ඇසුරෙන් මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 15)

ii. වැඩවලදී වෙනස්කම් කිරීමේ (Discrimination at work) ප්‍රතිවිපාක කවරේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

**ප්‍රශ්න අංක 04**

i. "ආයතනික වැරදි ක්‍රියාවන් හෙළිදරව් කරන විස්ල්-බ්ලොවර්වරුන් (Whistle-blowers) එම වැරදි, වාර්තා කිරීමට ප්‍රථම විවිධ සාධක කෙරෙහි තම අවධානය යොමු කරයි". මෙම ප්‍රකාශය සමග ඔබ එකග වේද? පහදන්න.

(ලකුණු 15)

ii. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේදී සැලකිලිමත් විය යුතු පොදු මුලධර්ම කවරේද? පහදන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

**ප්‍රශ්න අංක 05**

i. හොච්ස්චයිල්ඩ් (1983) විසින් හඳුනාගෙන ඇති පරිදි චිත්තවේගීය ශ්‍රමය (Emotional labour) ඉටු කිරීමේ ආකාර දෙක ලෙස "මතුපිට ක්‍රියාකාරිත්වය" (Surface acting) සහ "ගැඹුරු ක්‍රියාකාරිත්වය" (Deep acting) දැක්විය හැක. මෙම ආකාර දෙක උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 15)

ii. "නිසි ලෙස පාලනය වන සහ පූර්ණ වශයෙන් උපයෝගී කරගත් ආයතනික විවිධත්වය, ඕනෑම සංවිධානයකට වත්කමකි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

**ප්‍රශ්න අංක 06**

i. රැකියා - ජීවිත සමබරතාවය ඇතිකිරීම සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක නීතිමය විධිවිධාන කවරේද? උදාහරණ යොදා ගෙන පහදන්න.

(ලකුණු 15)

ii. වැඩවලදී වෙනස් කොට සැලකීම අවම කිරීමට ඔබ ඉදිරිපත් කරන උපාය මාර්ග කවරේද? උදාහරණ යොදා ගෙන පහදන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

*****